**2025 වර්ෂය සඳහා ඒකාබද්ධ කාර්යාල සේවක සේවයේ අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල රැස්වීම 2024.08.23**

**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

ඒකාබද්ධ කාර්යාල සේවක සේවයේ නිලධාරීන්ගේ අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල රැස්වීම 2024.08.23 දින පෙ.ව.10.00 ට භාණ්ඩාගාර පැරණි ගොඩනැගිල්ලේ තුන්වන මහලේ කාමර අංක 326 දී පහත නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

ස්ථාන මාරු මණ්ඩලය :

**නිර්මලී කුමාරගේ මහත්මිය** - සභාපති
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

**කේ.සත්‍යකුමාර් මයා** - සාමාජික
අධ්‍යක්ෂ

**එච්.ඒ.වී.කේ. පලන්සූරිය මෙය** - සාමාජික
සහකාර ලේකම්

වෘත්තිය සමිති නියෝජිතයින් :

I. කේ.ඒ.සසී සංජීව මහතා - රජයේ කාර්යාල සේවක සේවා සංගමය
II. කේ.ඩී.ප්‍රේමදාස මහතා - රජයේ කාර්යාල සේවක සේවා සංගමය

02. 2025 වසරේ රේගු දෙපාර්තමේන්තුවේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කරන කාර්යාල සේවක සේවයේ නිලධාරීන්ගේ පුරප්පාඩු 38ක් පැවතිණි. ඒ අනුව අමාත්‍යාංශය තුළ සේවා කාලය සැලකිල්ලට ගෙන ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ අනුපිළිවෙලට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට ස්ථාන මාරුවීමට ඉදිරිපත් කර තිබූ ඉල්ලීම් අනුව එම දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරුවීම් ලබාදෙන ලදී.

03. ඒ අනුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවෙහි පවතින ඒකාබද්ධ කාර්යාල සේවක සේවයේ පුරප්පාඩු 38 සඳහා වයස අවු. 55ට වැඩි නිලධාරීන් 10:2 අනුපාතය පදනම් කරගෙන 03 දෙනෙකු නම් කරන ලද අතර, ජ්‍යෙෂ්ඨතා ලේඛනය අනුපිළිවෙල පදනම් කර ගෙන අනෙකුත් පුරප්පාඩු 35 සඳහා ස්ථාන මාරුවීම් ලබාදෙන ලදී.( ඇමුණුම් **01** )

04. සුරාබදු දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු සඳහා නිලධාරීන් දෙදෙනෙකු විසින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

| | නිලධාරිනියගේ නම | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරුව ඉල්ලා ඇති දෙපාර්තමේන්තුව |
|---|---|---|---|
| 1 | පී.ආර්.යූ.ජී.පී.එන්. සමරතුංග මිය | තක්සේරු දෙපාර්තමේන්තුව | සුරාබදු දෙපාර්තමේන්තුව - මහනුවර කාර්යාලය |
| 2 | බී.ජී.කපිල බණ්ඩාර මහතා | තක්සේරු දෙපාර්තමේන්තුව | සුරාබදු දෙපාර්තමේන්තුව - බදුල්ල කාර්යාලය |

05. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු සඳහා නිලධාරීන් දෙදෙනෙකු විසින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

| | නිලධාරිනියගේ නම | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරුව ඉල්ලා ඇති දෙපාර්තමේන්තුව |
|---|---|---|---|
| 1 | ඩී.ගුණසේකර මිය | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| 2 | යූ.ඒ.එල්.එන්.ලීලාරත්න මිය | තක්සේරු දෙපාර්තමේන්තුව | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |

06. එසේම සුරාබදු දෙපාර්තමේන්තුව හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති ඉහත නම් සඳහන් නිලධාරීන් වෙත අනුප්‍රාප්තික නිලධාරීන් ලබා ගැනීම සඳහා මෙම තොරතුරු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.

.................................

**නිර්මලී කුමාරගේ මහත්මිය**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
(සභාපති)
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

නිර්මලී ප්‍රියංගනී කුමාරගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
කොළඹ 01

.................................

**කේ. සත්‍යකුමාර් මයා**
අධ්‍යක්ෂ
(සාමාජික)
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

.................................

**එච්.ඒ.වී.කේ. පලන්සූරිය මෙය**
සහකාර ලේකම්
(සාමාජික)
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

එච්. ඒ. වී. කේ. පලන්සූරිය
සහකාර ලේකම්
මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
කොළඹ 01